WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022(2023)
**General Certificate of Education (Ord. Level) Examination, 2022(2023)**

| | |
|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍යය | I, II |
| சிங்களமொழியும் இலக்கியமும் | I, II |
| Sinhala Language and Literature | I, II |

## සිංහල භාෂාව හා සාහිත්‍යය II

※ ප්‍රශ්න **සියල්ලට ම** උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් මූර්ධජ අක්ෂර සහිත වචන **දෙකක්** ලියන්න.
"විදුහලේ දියුණුව වෙනුවෙන් සියලු ළමයි තම ශ්‍රමය හා කාලය කැප කරති."

(ii) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත්, අව්‍යයීභාව සමාසයට අයත් වචන **දෙකක්** ලියන්න.
"අනවශ්‍ය කලබලයකින් තොර ව, ලැයිස්තුවේ නම් සඳහන් අනුපිළිවෙළට, අලුත් පොත් ලබාගැනීම සඳහා පැමිණෙන ලෙස විදුහල්පතිතුමා ළමයින්ට දැන්වීය."

(iii) පහත සඳහන් පද නිවැරදි ව විසන්ධි කර ලියන්න.
(අ) නැණැති (ආ) අත්‍යවශ්‍ය

(iv) පහත සඳහන් වාක්‍යයේ අක්ෂර වින්‍යාස දෝෂ සහිත වචන දෙකක් ඇත. එම වචන **දෙක** පමණක් නිදොස් කර ලියන්න.
"ප්‍රකාශන විලාශය යනු ලේඛකයා සිය වාංමාලාවෙන් තෝරා ගන්නා වචන ගළපා සිය ලේඛනය නිර්මාණය කිරීමේ දී අනුගමනය කරන තානය, තාලය හා වාගලංකරන ආදිය යි."

(v) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.
(අ) වනාන්තරයෙහි හට ගන්නා ගින්න
(ආ) සැම කල්හි ම පවතින

(vi) පහත දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර ලියන්න.
(අ) ශිෂ්‍යයෝ සිංහරාජයට ඇතුළු වූහ'යි වනාරක්ෂක නිලධාරීහු අනුමාන කරති.
(ආ) ළමයින් හෝ දෙමාපියෝ හෝ ශ්‍රමදානයට සහභාගි වෙති.

WWW.OLEVELAPI.COM

(vii) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
(අ) දුර්ලභ (ආ) ජංගම

(viii) පහත සඳහන් යෙදුම්වල තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා පද ප්‍රවර්ගය නම් කරන්න.
(අ) විනෝද චාරිකාව අතරතුර දී ශිෂ්‍යයෝ ගී **ගයමින්** ප්‍රීති වූහ.
(ආ) "සැලළිහිණිය **වදු** කැලණිය පුරවරට"

(ix) පහත සඳහන් යෙදුම්වල පළමුවැනි වචනය සමඟ දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවැනි වචනය හෝ දෙවැනි වචනය සකස් කර ලියන්න.
(අ) විදෙස් ප්‍රවෘත්ති
(ආ) කල්‍යාණ මිතුරා

(x) පහත සඳහන් වාක්‍ය කර්තෘ කාරකයට හරවා ලියන්න.
(අ) රියැදුරන් විසින් රථ පෙළපාළියක් සංවිධානය කරන ලදි.
(ආ) නිවේදකයා විසින් රසිකයන් වෙත ගායකයෝ හඳුන්වා දෙනු ලබති. (ලකුණු 02 × 10 = 20 යි)

[හත්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**2.** පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් **එකක්** තෝරාගෙන **වචන 250කට නො අඩු** වන සේ රචනයක් ලියන්න. **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

(අ) ලෝකයේ බොහෝ රටවල පවතින්නේ පානය කිරීම සඳහා භාවිත කළ නොහැකි දූෂිත ජල මූලාශ්‍රයන් ය. මෑතක් වනතුරු ම ශ්‍රී ලංකාවේ ජල මූලාශ්‍රය මානව පරිභෝජනයට යොදාගත හැකි මට්ටමේ පැවතුණ ද මේ වන විට ඒවායෙන් බහුතරයක් පරිභෝජනයට නුසුදුසු මට්ටමේ පවතින බව පර්යේෂකයෝ පවසති. කර්මාන්තශාලාවලින් අවිධිමත් පරිදි අපද්‍රව්‍ය මුදාහැරීම ජල දූෂණයට බලපාන ප්‍රමුඛතම සාධකයක් වන බැවින් එය වැළැක්වීමට පවත්නා නීති-රීති දැඩි කිරීමක් නව නීති හඳුන්වා දීමත් මෙහි දී සිදු කළ යුතු ය.

(ආ) දිනෙන් දින ඉහළ යන විදුලිබිල පාරිභෝගිකයන්ට මෙන් ම රාජ්‍ය ආයතනවලට ද දරාගත නොහැකි මට්ටමක පවතී. වසරෙන් වැඩි කාලයක් දැඩි හිරු රශ්මියක් පවතින ශ්‍රී ලංකාව වැනි රටක සූර්ය බලශක්තිය උත්පාදනය කිරීම අපහසුතාවකින් තොර ව සිදු කළ හැකි ය. මේ සඳහා අවශ්‍ය වන තාක්ෂණික දැනුම සහිත විශේෂඥයන් පුහුණු කිරීමට සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට පියවර ගැනීමෙන් මේ අර්බුදයට පිළියම් සෙවිය හැකි ය.

(ඉ) කාටූන් යනු මෙරට ළමා පරපුර අතර බෙහෙවින් ජනප්‍රිය රූපවාහිනී වැඩසටහන් විශේෂයකි. බහුතරයක් කාටූන් නිර්මාණවල අන්තර්ගත වන්නේ විදේශීය පසුබිමක් සහිත අද්භූත කථා පුවෘත්තීන් ය. ළමයින් අතර වඩාත් ජනප්‍රිය මේ නිර්මාණ විශේෂය සඳහා ශ්‍රී ලාංකේය සමාජ සංස්කෘතික පසුබිම පිළිබඳ ව කියැවෙන ජනකතා යොදා ගැනීමට අවධානය යොමු කළහොත් දේශීය සම්ප්‍රදායයේ පැතිකඩ ගණනාවක් ළමා මනසෙහි රෝපණය කළ හැකි ය.

(ඊ) ඖෂධ හිඟය, පුහුණු වෛද්‍යවරුන්ගේ හිඟය මෙන් ම වෛද්‍ය උපකරණවල හිඟය ද හේතුවෙන් මෙරට රෝගීන්ට විධිමත් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමේ අවකාශය අහිමි වෙමින් පවතී. මේ ගැටලුවලට ස්ථිරසාර පිළියම් සොයන අතරේ ම මෙරටට ආවේණික වූ පාරම්පරික ව පවත්වා ගෙන එනු ලබන දේශීය වෛද්‍ය සම්ප්‍රදායය විධිමත් ව වැඩිදියුණු කිරීම කෙරෙහි ද අවධානය යොමු කිරීම කාලෝචිත ය.

(ලකුණු 25 යි)

**3.** පහත සඳහන් පාඨය වචන **60 - 70** අතර වන සේ **සාරාංශ කොට** ලියන්න. ඔබේ සාරාංශයේ වචන සංඛ්‍යාව උත්තරය අග සඳහන් කරන්න.

ජනමාධ්‍ය නියාමනය මඟින් අපේක්ෂා කෙරෙන අරමුණු දෙකක් පවතී. ඒවායින් එකක් වන්නේ මාධ්‍ය භාවිතය ප්‍රමිති සහගත එකක් බවට පත් කිරීම ය. අනෙක වන්නේ මාධ්‍යයේ පවතින සමාජ වගකීම පිළිබඳ අදහස් තහවුරු කිරීම ය. මාධ්‍ය නියාමනයේ ද ස්වරූප දෙකක් හඳුනාගත හැකි ය. අදාළ නියාමන ක්‍රියාවලිය මඟින් ජනමාධ්‍ය ක්‍රියාකාරිත්වයේ වර්තමාන ස්වරූපය හඳුනා ගැනීම සහ එහි අනාගත පැවැත්ම පිළිබඳ අවශ්‍ය ප්‍රතිපත්තිමය රාමුව සකස් කිරීම ය. ඍජු හා වක්‍ර යන ආකාර දෙකින් නියාමන ක්‍රියාවලිය සිදු වේ. එහි දී ඍජු නියාමන ක්‍රියාවලියට අදාළ ව රාජ්‍ය අණපනත්, නීතිරීති හා කෙටුම්පත් සම්බන්ධ ප්‍රායෝගික භාවිතය කෙරෙහි අවධානය යොමු කෙරේ. වක්‍ර නියාමනය යනු ස්වයං නියාමනය යි. ඒ යටතට මාධ්‍ය ආචාරධර්ම අයත් වේ. මාධ්‍ය නිදහස අපේක්ෂා කරන ජනමාධ්‍යවේදීන් විසින් වඩාත් ම අපේක්ෂා කරනු ලබන්නේ ස්වයං නියාමනය යි. ඉහත සඳහන් කෙරුණු ද්විත්ව නියාමන ක්‍රියාවලිය මඟින් ජනමාධ්‍ය කිසියම් පාලනයකට අනුකූල වේ. එහි දී හිමිකාරිත්වයේ අරමුණු සංතෘප්ත කිරීම පමණක් ජනමාධ්‍යවේදීහු අපේක්ෂා නො කරති. නිදහස් මාධ්‍ය සංස්කෘතියේ ගොඩනැගීම මෙන් ම ලිබරල්වාදී වෙළෙඳපොළ ආර්ථික රටාව හමුවේ වඩාත් පුළුල් මාධ්‍ය ක්‍රියාකාරිත්වයක් ද ඔවුහු අපේක්ෂා කරති. මාධ්‍ය නියාමනය සඳහා පූර්ණ වශයෙන් රාජ්‍ය මැදිහත්වීම පමණක් ප්‍රමාණවත් නො වේ. වඩාත් යෝග්‍ය වන්නේ ඒ සඳහා ස්වයං නියාමනය පිළිබඳ ජනමාධ්‍යවේදීන්ගේ ආකල්ප දියුණු කිරීම ද ඊට සමගාමී ව සිදු කළ යුතු වීම යි. වඩාත් ඵලදායී මාධ්‍ය නියාමනයක් සිදු වන්නේ එවිට ය.

(ලකුණු 10 යි)

**4.** පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර සපයන්න.

සාමූහික ආයාසයෙහි සහ පොදු අරමුණු සඳහා වැඩ කිරීමෙහි පුහුණුවක් ලබා ගැනීම සඳහා නාට්‍යයෙහි ඇති වටිනාකම ක්‍රීඩාවෙහි ඇති වටිනාකමට නොදෙවැනි බව ප්‍රකාශ කිරීම යෝග්‍ය ය. ක්‍රීඩාවෙන් නොලැබෙන වාසි දෙකක් නාට්‍යයෙන් ලැබේ. එනම්, නාට්‍ය කටයුතුවල දී වඩා විශාල කෞශල්‍ය සංඛ්‍යාවක් පුහුණු කිරීමට අවස්ථාව ලැබීම සහ මේ සියලු ම කෞශල්‍ය සඳහා යම්කිසි ප්‍රමාණයක උත්පාදක ශක්තියක් ලැබිය හැකි වීම ය. තමා අවසානයේ දී රඟපාන කොටස නළුවා විසින් මවනු ලබන බව අමතක නො කළ යුතු ය. අධ්‍යක්ෂට කළ හැක්කේ, එය කළ යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ ව නළුවාට ඉඟි කිරීම පමණකි. එහෙත් එය නළුවා සඳහා මැවීම නම් මහුට කළ නො හැකි ය. වේදිකා සැරසිලිකරු, ඇඳුම් සැලසුම්කරු, වෙස් ගැන්නුම්කරු සහ ආලෝක සැලසුම්කරු යන තැනැත්තනට හිමි වන්නේ ද එවැනි ම තත්ත්වයකි. නාට්‍ය මඟින් යම්කිසි අදහසක් ප්‍රකාශ කිරීම ප්‍රථමයෙන් නිෂ්පාදකයාගේ සිතෙහි ජනිත වේ. එය පසුව ප්‍රකාශ වන්නේ එය නිෂ්පාදනය කිරීමෙහි ලා සම්බන්ධ වන විවිධ පුද්ගලයන් විසිනි.

[අටවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

තමාගේ රඟ දැක්වීමෙහි ඇති උසස් පහත් බව නාට්‍යයෙහි අනෙකුත් නළුවන්ගේ රඟ දැක්වීම මත මුළුමනින් ම රැඳී ඇත්තේ ය යන වටිනා පාඩම ද නළුවා ඉගෙන ගනියි. නළුවකුට තනිව ම කොටසක් රඟ පෑමට සිදු වන්නේ කලාතුරකිනි. සුළු කොටස් රඟපාන්නවුන්ගේ සහාය නොලැබෙන්නේ නම්, නළුවකුට නාට්‍යයක ප්‍රධාන කොටසක් රඟපාන විට පවා උසස් තත්ත්වයකට පත් විය නො හැකි ය. එබැවින්, නාට්‍ය නිෂ්පාදනයෙහි ප්‍රධාන හෝ අප්‍රධාන හෝ යනුවෙන් රඟ දැක්වීම් කොටස් නොමැති බවත්, නාට්‍යය වනාහි විවිධ අවස්ථාවන්හි දී වේදිකා භාණ්ඩ එහා මෙහා ගෙන යන සහායකයන් විසින් පවා අත්‍යවශ්‍ය කාර්යයන් ඉටු කරනු ලබන සාමූහික ප්‍රයත්නයක් බවත් යනුවෙන් යම් කිසිවකු කරන ප්‍රකාශයෙහි කිසියම් අර්ථයක් ඇත්තේ ය. එබැවින්, නාට්‍ය රඟ දැක්වීම සම්බන්ධයෙන් ලබාගන්නා අද්දැකීම, පොදු අරමුණක් සඳහා ක්‍රියා කිරීමේ ද පෞද්ගලික කීර්තිය ලබා ගැනීමෙන් තොර ව මුළු ආයාසය සාර්ථක කර ගැනීම සඳහා සහාය වීමේ ද තෘප්තියක් ලබා ගතහැකි මඟක් වශයෙන්/ළමයින්ට බෙහෙවින් ප්‍රයෝජනවත් වන්නේ ය.

නාට්‍යයක් නිෂ්පාදනය කිරීම නිසා අන් කිසිදු සාමූහික ක්‍රියාවක් මඟින් ඇති නොවන පමණට පුද්ගලයන් සමූහයක් අතර අන්‍යෝන්‍ය අවබෝධය ඇති වෙතැයි පැවසීම නිවැරදි ය. නාට්‍යයක් නිෂ්පාදනය කිරීමේ දී කලාකරුවෝ එනම්, පුද්ගලාර්ථවාදීහු ද බොහෝ විට අල්ප නොවූ මමත්වයක් ඇති පුද්ගලයෝ ද විශාල සංඛ්‍යාවක් එක් වෙති. නිෂ්පාදකයා ද සිය නළුනිළියන්ගේ දුර්වලකම් අවංක ව පෙන්වා දෙන විට ඒවා පිළිගැනීමට ඔවුනට සිදු වේ.

(i) මේ ඡේදයෙහි සඳහන් වන පරිදි නාට්‍යයෙන් ලබාගත හැකි වාසි **දෙක** මොනවා ද?

(ii) කිසියම් නාට්‍යයක අන්තර්ගත වන අදහස ප්‍රකාශයට පත් කරන්නෝ කවරහු ද?

(iii) නාට්‍යයකින් නළුවකු ඉගෙන ගන්නා පාඩම කුමක් ද?

(iv) නාට්‍යයක් රඟ දැක්වීම සම්බන්ධයෙන් ලබාගන්නා අද්දැකීම ළමයින්ට බෙහෙවින් ප්‍රයෝජනවත් වන්නේ කවර හෙයින් ද?

(v) නළුනිළියන්ගේ දුර්වලකම් අවංක ව පෙන්වා දෙනු ලබන්නේ කවරකු විසින් ද?

(ලකුණු 02 × 5 = 10 යි)

**5.** ඔබේ ප්‍රදේශයේ ඇති හෝ ඔබ දන්නා සංචාරක ස්ථානයක් වෙත දේශීය සංචාරකයන් ආකර්ෂණය කරගැනීම සඳහා යෝග්‍ය අත්පත්‍රිකාවක් සකස් කරන්න. එහි දී පහත සඳහන් කරුණු පිළිබඳ සැලකිලිමත් වන්න.

- සංචාරක ස්ථානයෙහි ස්වභාවය
- එම ස්ථානය ආකර්ෂණීය ස්ථානයක් වීමට හේතු
- ගමන් පහසුව සලසා ගන්නා ආකාරය
- සංචාරකයන් විසින් අනුගමනය කළ යුතු දේ

අත්පත්‍රිකාවට වචන 100ක් පමණ සෑහේ.

**නැතහොත්**

විජයපුර විද්‍යාලයේ විද්‍යා ප්‍රදර්ශනයේ ආරම්භක දිනයට පැමිණි පුවත්පත් වාර්තාකරුවකුගේ කෙටි සටහනක් පහත දැක්වේ.

WWW.OLEVELAPI.COM

| | |
|---|---|
| විද්‍යා ප්‍රදර්ශනය | – 2023.05.18 |
| ප්‍රධාන අමුත්තා | – පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා |
| ප්‍රධාන අමුත්තාගේ කථාව | – විද්‍යා ප්‍රදර්ශනයක වැදගත්කම |
| | – ප්‍රදර්ශන කුටිවල සුවිශේෂතාව |
| | – අවට පාසල්වල සිසුන්ට ලැබෙන ප්‍රතිලාභ |
| | – ප්‍රදර්ශන සංවිධානයට පළාතෙන් ලැබෙන අවස්ථා |
| විදුහල්පතිතුමාගේ කථාව | – ප්‍රදර්ශනය සංවිධානය කිරීමට ගුරුවරුන්ගෙන්, දෙමාපියන්ගෙන් සහ සිසුන්ගෙන් ලැබුණු සහයෝගය |
| | – ප්‍රදර්ශනයේ වැදගත්කම |

ඉහත තොරතුරු පදනම් කරගෙන පුවත්පතකට යැවීම සඳහා සුදුසු වාර්තාවක් සකස් කරන්න. විජයපුර මාණ්ඩලික වාර්තාකරු කවිඳු ගුණරත්න ඔබ යයි සිතන්න. (වචන 100ක් පමණ සෑහේ.)

(ලකුණු 15 යි)

* * *

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 | S | III**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Ord. Level) Examination, 2022(2023)

| | |
|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍යය III | පැය දෙකයි |
| சிங்களமொழியும் இலக்கியமும் III | இரண்டு மணித்தியாலம் |
| Sinhala Language and Literature III | Two hours |

## සිංහල භාෂාව හා සාහිත්‍යය III

**වැදගත් :** උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් උත්තර සපයන්න.
※ **1, 2, 3, 4** ප්‍රශ්නවලටත්, **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකටත්** උත්තර සපයන්න.
මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) "ඇතුළු නුවර දී රහස් කියන්නට නොපිළිවන. මඟුල් උයනට යම්හ."
 (අ) මේ ප්‍රකාශය කරන ලද්දේ කවරකු විසින් ද?
 (ආ) එය ශ්‍රවණය කළේ කවරකු ද?

(ii) පහත දැක්වෙන කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

කෙළෙහි ගුණ සින්දේ
මූසිල අන්ද මන්දේ
(අ) ..............................
(ආ) ..............................

(iii) "කවදාවත් ඕකෙන් පිට වෙලා එන්ඩ ඉඩ හම්බ වෙන්නෙ නෑ මිනිහෙකුට"
 (අ) මෙහි 'ඕකෙන්' යනුවෙන් අදහස් කළේ කුමක් ද?
 (ආ) මේ ප්‍රකාශය හා සබැඳි අවස්ථාව කුමක් ද?

(iv) ඉටු කොට කළ යුතු යුතුකම්
ලැබුණත් ලෝකෙන් ගැරහුම්
ඉවසන්නට පුළුවන් නම්
උඹයි මගේ පුතා උතුම්
 (අ) කවියට අනුව උතුම් පුතකු සතු ලක්ෂණය ලියන්න.
 (ආ) මේ කවිය ඇතුළත් පැදි පෙළේ රචකයා නම් කරන්න.

(v) "තෙල අහස සිට නැටූ විද්දත් දූවගේ පියාට දී ලා තමාගේ දුව ම පුතුන්ට පාවා දෙන්ට කියව."
 (අ) මෙහි විද්දත් පියාට දෙන්නට යැයි කීවේ මොනවා ද?
 (ආ) මේ ප්‍රකාශය ශ්‍රවණය කළේ කවරකු ද?

(vi) "රජයට හෝ දිවියට හෝ අන්තරාය වෙයි යන සිතින් නිදි නො ලත්මී."
 (අ) මේ ප්‍රකාශය ශ්‍රවණය කළ පුද්ගලයාගේ නම කුමක් ද?
 (ආ) මෙහි සඳහන් අයට නිදි නොලැබීමට බලපෑ හේතුව කුමක් ද?

(vii) "ඇහැටවත් නොපෙනෙන සතුන්ට පුළුවන් ද මෙච්චර ලොකු මිනිස් ඇඟකට හානි කරන්න?"
 (අ) මේ ප්‍රකාශය උපුටා ගත් නිර්මාණයේ නම ලියන්න.
 (ආ) මේ ප්‍රකාශය කිරීමට හේතු වූ කරුණ කුමක් ද?

[දෙවැනි පිටුව බලන්න.

WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(viii) ඔය ඇල දොඩමලු ය, සුවඳ බැරුවා ඉන්ට
නිල් වතුර තුරුලු කර කෙසේ අතහැර යම් ද?
**කෙකටියා පඳුර සුදු මල් පොකුර වඩාගෙන**
සොඳුර, නුඹ වාගේ ම හිනැහේය මා එක්ක

(අ) මේ පද්‍ය ඛණ්ඩය ඇතුළත් කාව්‍ය නිර්මාණයේ රචකයා නම් කරන්න.
(ආ) තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදයෙන් පැවසෙන අදහස ලියන්න.

(ix) රාජ කුමරියෝ පලඳිති
රන් මිණි බරණා
සිනිඳු වස්ත්‍ර හැඳලා රන්
මිරිවැඩි සඟලා
**පින් පිඩ වැනි මා මැණිය**
කියනු නොවළහා

(අ) මේ ප්‍රකාශය කළ අයගේ නම ලියන්න.
(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදයේ අන්තර්ගත කාව්‍යාලංකාරය කුමක් ද?

(x) (අ) පන්සිය පනස් ජාතක කථා පොත රචනා කිරීම සඳහා පාදක කර ගෙන ඇති ග්‍රන්ථය කුමක් ද?
(ආ) 'පූජාවලිය' කෘතියෙහි කතුවරයාගේ නම ලියන්න.

(ලකුණු 02 × 10 = 20 යි)

2. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) "මහ බෝසතාණන් වහන්සේ ද, ඔද වැඩියා වූ සාගරය පරිද්දෙන් පොළොව මැඩ පියන්නා සේ වීථිය පුරා ගෙන යන්නා වූ ඇත් අස් ආදි වූ පරිවාරයෙන් යුක්ත වැ **අසම්භිත වැ**, වාසල් දොර හරවා, නුවරින් නික්ම, රථයෙන් බැස, කෙසරු සලා විදහා කිලිපොළන්නා වූ සිංහ රාජයකු සේ **විජෘම්භනය** කෙරෙමින්, ධර්ම යුද්ධ මණ්ඩලයට ම වැඩි සේක"

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.
(ආ) මහ බෝසතාණන් ධර්ම යුද්ධ මණ්ඩලයට පිවිසි අයුරු කෙටියෙන් විස්තර කරන්න.

(ii) රූ රැසේ අඳිනා ලෙසේ අත්
ලෙළ දිදී විදුලිය පබා
රන් රසේ එක් වන ලෙසේ වෙණ
නාදනු පා කබ තබා
කම්පසේ දෙන සැර ලෙසේ දෙස
බල බලා නෙතගින් සබා
මම් කෙසේ පවසම් එසේ වර
සුර ළඳුන් දුන් රඟ සුබා

(අ) මෙහි දැක්වෙන උපමා **දෙකක්** ලියන්න.
(ආ) සුරඟනන්ගේ රංගනයේ ස්වභාවය කවියා විස්තර කර ඇත්තේ කෙසේ දැයි කෙටියෙන් ලියන්න.

(iii) "එ කල්හි මහාජනයෝ කොසොල් රජු ගෙ **ගෙවඳ්දොර** රැස් වැ 'මහරජ, තොප ගෙ රට අඟුල්මල් නම් සොරෙකැ, දරුණු, ලෙමුඩු අත් ඇත්තෙ යැ, සතුන් කෙරෙහි **කුළුණු** නැත්තෙ යැ, ගම් නොගම් කෙළෙ, නියම්ගම් නොනියම්ගම් කෙළෙ, දනවු නොදනවු කෙළෙ, මිනිසුන් මරා ඇඟිලි විදැ මාලා කොටැ ධරයි. ඔහු වළකා' යි කියා මහ හඬින් හැඬූහු"

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.
(ආ) මහජනයා අංගුලිමාල පිළිබඳ ව රජතුමාට කළ විස්තරය කෙටියෙන් දක්වන්න.

(iv) **සා ර පලය** අඹ දඹ රඹ ද වල් සිට
මී ර ජලය ඇළ දොළ කඳු පිටින් බට
**නෑ ර ලොලය** වඩවන දුටු දනාණ් හට
කෑ ර ගලය වැජැඹෙයි මේ ලෙසින් සිට

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.
(ආ) කෑරගල ඇති සශ්‍රීකත්වය කවියා වර්ණනා කර ඇති ආකාරය කෙටියෙන් දක්වන්න.

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(v) වල දිත අදහසින් මෙන් සුර ගඟ අඟන
**නල බල සසල දළ රළ පෙළ නුබ නැඟෙන**
වෙල ළස ගැවැසි මුතු සක් පබළු බබළන
බල මහ මුහුද එම සඳැ උතුරින් පෙනෙන

(අ) තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදයෙන් දැක්වෙන කාව්‍යාලංකාරය කුමක් ද?

(ආ) මහ මුහුදෙහි ස්වභාවය කවියා වර්ණනා කර ඇති ආකාරය කෙටියෙන් ලියන්න.

(ලකුණු 04 × 5 = 20 යි)

3. ● අර්ථ රසයත්
● ශබ්ද රසයත්

මනාව සංකලනය කිරීම හංස සන්දේශයේ සාර්ථකත්වයට හේතු වී ඇත. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

● විද්දත් දියණියගේ චරිතයත්
● උග්ගසේන සිටුපුත්ගේ චරිතයත්

මගින් මතු කෙරෙන පරස්පර විරෝධී චරිත ලක්ෂණ කථා රසය තීව්‍ර කිරීමට හේතු වී ඇත. උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව ඇසුරෙන් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි)

4. ● දරිද්‍රතාවට ගොදුරුවීමත්
● අන්ධ විශ්වාසයන්ට නතුවීමත්

බැද්දේගම විසූ ගැමියන් විනාශ මුඛයට යාමට හේතු වූ ප්‍රධාන කරුණු ලෙස දැක්විය හැකි ය. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

**නැතහොත්**

● උපයුක්ත භාෂා ශෛලියත්
● උචිත කාව්‍ය උපක්‍රම භාවිතයත්

ගංගාවේ සංගීතය කාව්‍ය නිර්මාණය පාඨක සිත් ඇද ගැනීමට හේතු වී ඇත. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

● **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න.

WWW.OLEVELAPI.COM

5. 'දියමන්ති මාලය' කෙටි කතාවේ මැටිල්ඩාගේ චරිතයෙන් නිරූපණය කෙරෙනුයේ තම තරම නොදැන ජීවත් වීමට යාමෙන් ව්‍යසනයට පත්වන්නන්ගේ යථා ස්වභාවය යි. උදාහරණ **තුනක්වත්** දක්වමින් විමසන්න.

(ලකුණු 10 යි)

6. බුදුරජාණන් වහන්සේ 'අඟුල්මල් දමනය' කළ අවස්ථාව කතුවරයා විස්තර කරනුයේ පාඨකයාගේ සිතෙහි වාක් චිත්‍රයක් මැවෙන ආකාරයෙනි. අමාවතුර නිර්දිෂ්ට කොටසින් උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 10 යි)

7. මිනිස් දිවිය අර්ථවත් කර ගැනීම උදෙසා ජන කවියෙන් මග පෙන්වා ඇති අයුරු 'භානා හීය පානා අඬහැරෙන් ඇනේ' පාඩම ඇසුරෙන් උදාහරණ **තුනක්වත්** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

* * *

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...